# ගෙවුම් තුලනය


ජංගම ගිණුම මෙන්ම සමස්ථ ශේෂය අනුව ද බලන කල 1985 ගෙවුම් තුලන ප්‍රතිඵල සෑහෙන දුරට පිරිහී ගිය තත්ත්වයක පැවතුණි. වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හා සේවා ගිණුමේ පැවති හිඟයයන් ද පුළුල් විය. ශුද්ධ පෞද්ගලික සංක්‍රාම සුළු වශයෙන් අඩු වූ අතර නිළ සංක්‍රාම සැළකිය යුතු ලෙස පහත වැටිණි. ඒ අනුව, 1984 දී රුපියල් දශ ලක්ෂ 1400 ක් (විගැහි දශ ලක්ෂ 51 ක්) වූ ජංගම ගිණුමේ හිඟය 1985 දී රුපියල් දශ ලක්ෂ 11,532 (විගැහි දශ ලක්ෂ 417) දක්වා වැඩි වූ අතර එම හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් හැටියට ගතහොත් 1984 දී සියයට 0.8 සිට 1985 දී සියයට 7.2 දක්වා වැඩි විය. නිළ සංක්‍රාම අත් හැරීමෙන් පසු 1984 දී රුපියල් දශ ලක්ෂ 6,554 (විගැහි දශ ලක්ෂ 249) ක් වූ ජංගම ගිණුමේ හිඟය රුපියල් දශ ලක්ෂ 15,528 (විගැහි දශ ලක්ෂ 559) දක්වා වැඩි වූ අතර එම හිඟය හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය මෙම දෙවසර තුළදී සියයට 4.2 සිට සියයට 9.6 දක්වා පුළුල් විය.

මූලික වෙළෙඳ ද්‍රව්‍යවල මිළ ගණන් අසතුටුදයක වීම, සම්ප්‍රදායික නොවන කෘෂිකාර්මික අපනයන බොහොමයක පැවති දුර්වල තත්ත්වය හා ආනයන පරිමාවන් ඉහළ යෑම හේතුකොටගෙන 1985 දී තරමක විශාල වෙළෙඳ හිඟයක් ඇති විය. 1984 වර්ෂයේ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 11,850 (විගැහි දශ ලක්ෂ 453) හා සසඳන විට 1985 දී එම හිඟය රුපියල් දශ ලක්ෂ 19,328 (විගැහි දශ ලක්ෂ 697) ක් බවට පත් විය. විගැහි වටිනාකම අනුව අපනයන සියයට 10 කින් පහත වැටුණු අතර ආනයන සියයට 5.3 කින් ඉහළ නැඟුණි.

1984 දී රුපියල් දශ ලක්ෂ 37,198 (විගැහි දශ ලක්ෂ 1,427) ක් ව පැවති වෙළෙඳ භාණ්ඩ අපනයන ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 35,382 (විගැහි දශ ලක්ෂ 1,284) දක්වා අඩු විය. 1985 දී අපනයන ඉපැයීම් මෙසේ අඩු වීමට තුඩු දුන් ප්‍රධාන හේතුව ප්‍රධාන වැවිලි නිෂ්පාදන වර්ග තුනෙන් ලැබූ අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 3,667 කින් හෙවත් විගැහි වටිනාකම් අනුව සියයට 22 කින් පහළ වැටීමය. තේ සහ රබර් අපනයන පරිමාවන් පිළිවෙලින් සියයට 3 කින් හා සියයට 6 කින් පහළ වැටුණු අතර ඒවායේ මිළ ගණන්ද පිළිවෙලින් සියයට 26 කින් හා සියයට 23 කින් අඩු විය. පොල් අපනයන ප්‍රමාණය සියයට 286 ක් තරම් වූ කැපී පෙනෙන මට්ටමකින් ඉහළ ගිය නමුත් ප්‍රධාන පොල් නිෂ්පාදන තුනෙහිම මිළ ගණන් සියයට 49 කින් පහළ වැටිණි. අපනයන පරිමාව මෙන්ම මිළ ගණන්ද පහත වැටීම නිසා සුළු කෘෂි නිෂ්පාදන අපනයනයන්ගෙන් ලද ඉපැයීම් සියයට 8 කින් පහළ වැටුණි. 1977 සිට නොකඩවා වැඩි වෙමින් පැවති රෙදිපිළි හා මසා නිම කළ ඇඳුම් අපනයන 1985 දී සියයට 1.0 කින් අඩු වූ අතර වර්ෂය තුළදී ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන සියයට 11.1 කින් වැඩි විය. අනිකුත් කාර්මික නිෂ්පාදන අපනයන සියයට 4.4 කින් පහළ වැටිණි. සම්ප්‍රදායානුකූල නොවන සියළුම අපනයනවලින් ලත් මුළු අපනයන ඉපැයීම් එකතුව 1985 දී සියයට 7.2 කින් ඉහළ නැඟුණි.

1984 දී රුපියල් දශ ලක්ෂ 49,048 (විගැහි දශ ලක්ෂ 1,880) ක් වූ වෙළෙඳ භාණ්ඩ ආනයන වියදම 1985 දී රුපියල් දශ ලක්ෂ 54,710 (විගැහි දශ ලක්ෂ 1981) දක්වා වැඩි විය. වසර තුළදී පාරිභෝගික භාණ්ඩ හා අන්තර් භාණ්ඩ සඳහා වූ ආනයන වියදම ඉහළ ගිය අතර ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන වියදම පහළ වැටිණි. ප්‍රධාන වශයෙන් සහල්, සීනි සහ තිරිඟු ආනයන වැඩි වීම නිසා ආහාර ආනයන සඳහා වූ වියදම වැඩි විය. පොහොර ආනයන වැඩි වීම, අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ වියදම විශාල වීමට ප්‍රධාන හේතුව විය.

## ගෙවුම් තුලනය
වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 32 සංඛ්‍යා සටහන
## 1981— 1985 ගෙවුම් තුලනය—විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1981 | 1982 | 1983(අ) | 1984(අ) | 1985 (ආ) | 1981 | 1982 | 1983(අ) | 1984(අ) | 1985 (ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ .. .. | -15,616 | -20,403 | -20,168 | -11,850 | -19,328 | - 693 | - 890 | - 801 | - 453 | - 697 |
| අපනයන .. .. | 20,507 | 21,098 | 25,038 | 37,198 | 35,382 | 903 | 918 | 993 | 1,427 | 1,284 |
| ආනයන .. .. | 36,123 | 41,501 | 45,206 | 49,048 | 54,710 | 1,596 | 1,808 | 1,794 | 1,880 | 1,981 |
| 2. සේවා .. .. | + 82 | - 314 | - 1,411 | - 1,735 | - 3,498 | + 4 | - 13 | - 56 | - 66 | - 127 |
| ලැබීම් .. .. | 6,019 | 6,962 | 8,033 | 8,567 | 8,957 | 265 | 304 | 320 | 329 | 324 |
| ගෙවීම් .. .. | 5,937 | 7,276 | 9,444 | 10,302 | 12,455 | 261 | 317 | 376 | 395 | 451 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) .. | -15,534 | -20,717 | -21,579 | -13,585 | -22,826 | - 689 | - 903 | - 857 | - 519 | - 824 |
| 4. සංක්‍රාම (ශුද්ධ) .. .. | + 7,036 | + 8,873 | +10,457 | +12,185 | +11,294 | + 308 | + 387 | + 416 | + 468 | + 407 |
| පෞද්ගලික (ශුද්ධ) .. .. | 3,918 | 5,494 | 6,441 | 7,031 | 7,298 | 172 | 240 | 256 | 270 | 265 |
| නිල (ශුද්ධ) .. .. | 3,118 | 3,379 | 4,016 | 5,154 | 3,996 | 136 | 147 | 160 | 198 | 142 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) .. | - 8,498 | -11,844 | -11,122 | - 1,400 | -11,532 | - 381 | - 516 | - 441 | - 51 | - 417 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය .. | + 7,691 | +10,954 | +10,616 | + 8,755 | + 9,273 | + 341 | + 477 | + 420 | + 335 | + 336 |
| පෞද්ගලික අංශය .. .. | 2,571 | 5,517 | 4,005 | 62 | 1,843 | 116 | 240 | 160 | 2 | 66 |
| රාජ්‍ය අංශය .. .. | 5,120 | 5,437 | 6,611 | 8,693 | 7,430 | 225 | 237 | 260 | 333 | 270 |
| දිගුකාලීන (ශුද්ධ) .. | 5,120 | 5,437 | 6,613 | 8,693 | 7,430 | 225 | 237 | 260 | 333 | 270 |
| ලැබීම් .. .. | (6,087) | (6,954) | (8,546) | (10,387) | (9,422) | (267) | (304) | (337) | (398) | (342) |
| ගෙවීම් .. .. | (967) | (1,517) | (1,933) | (1,694) | (1,992) | (42) | (67) | (77) | (65) | (72) |
| කෙටිකාලීන (ශුද්ධ) .. | — | — | - 2 | — | — | — | — | — | — | — |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | - 39 | - 124 | + 82 | - 39 | + 1,491 | — | — | — | — | — |
| 8. වැරදීම් හා අත්හැරීම් .. | + 188 | + 5 | + 766 | - 254 | - 292 | + 2 | + 21 | + 21·6 | + 13 | - 30 |
| 9. විගැහි වෙන් කිරීම් .. | 252 | — | — | — | — | 12 | — | — | — | — |
| 10. සමස්ථ ශේෂය .. .. | - 406 | - 1,009 | + 342 | + 7,062 | - 1,060 | - 26 | - 18 | + 0·6 | + 297 | - 111 |
| 11. මූල්‍ය වෙනස්වීම් (– අතිරික්තය) .. | + 406 | + 1,009 | - 342 | - 7,062 | + 1,060 | + 26 | + 18 | - 0·6 | - 297 | + 111 |
| ශ්‍රී ලංකා රුපියල්/විගැහි (විනිමය අනුපාතිකයේ සාමාන්‍යය) .. | | | | | | 22·67 | 22·98 | 25·16 | 26·08 | 27·63 |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

සටහන : මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

වසර තුළදී සේවා ගිණුමේ හිඟය, විගැහි වටිනාකම අනුව බලන විට දෙගුණයකට ආසන්න විය. 1984 දී රුපියල් දශ ලක්ෂ 1,735 (විගැහි දශ ලක්ෂ 66) ක් වූ සේවා ගිණුමේ හිඟය 1985 දී රුපියල් දශ ලක්ෂ 3,498 (විගැහි දශ ලක්ෂ 127) ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. වරාය, ප්‍රවාහන සහ රක්ෂණය වෙනුවෙන් වූ ශුද්ධ විදේශ විනිමය වියදම් වැඩි වීම, සංචාරක අංශයෙන් ලත් ශුද්ධ විදේශ විනිමය ඉපයීම් ප්‍රමාණය අඩු වීම හා අනිකුත් විවිධ සේවාවන් සඳහා වූ ශුද්ධ වියදම් වැඩි වීම, සේවා ගිණුමේ හිඟය පුළුල් වීමට තුඩු දුන් ප්‍රධාන සාධක විය.

**1.33 සංඛ්‍යා සටහන**

**සේවා සහ සංක්‍රාම 1984 – 1985**

රුපියල් දශ ලක්ෂ (වරහන් තුල විගැහි දශ ලක්ෂ)

| ශීර්ෂය | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1984(අ) | 1985(ආ) | වෙනස 1984/85 | 1984(අ) | 1985(ආ) | වෙනස 1984/85 | 1984(අ) | 1985(ආ) |
| වරාය, ප්‍රවාහනය සහ රක්ෂණ .. | 1,811<br>(69) | 1,969<br>(71) | + 158<br>(+2) | 1,497<br>(57) | 2,112<br>(77) | + 615<br>(+20) | + 314<br>(+12) | – 143<br>(–6) |
| සංචාර .. | 2,587<br>(99) | 2,197<br>(80) | – 390<br>(–19) | 1203<br>(46) | 1,342<br>(48) | + 139<br>(+2) | +1,384<br>(+53) | + 855<br>(+32) |
| ආයෝජන ආදයම් . | 1,479<br>(57) | 2,261<br>(82) | + 782<br>(+25) | 4,880<br>(187) | 5,671<br>(206) | + 791<br>(+19) | –3,401<br>(–130) | –3,410<br>(–124) |
| (1) ලාභ සහ ලාභාංශ | 1<br>(—) | 5<br>(—) | + 4<br>(—) | 292<br>(11) | 283<br>(10) | – 9<br>(–1) | – 291<br>(–11) | – 278<br>(–10) |
| (2) පොළී .. | 1,478<br>(57) | 2,256<br>(82) | + 778<br>(+25) | 4,588<br>(176) | 5,388<br>(196) | + 800<br>(+20) | –3,110<br>(–119) | –3,132<br>(–114) |
| රජයේ වියදම් . | 304<br>(12) | 312<br>(11) | + 8<br>(–1) | 295<br>(12) | 400<br>(14) | + 105<br>(+2) | + 9<br>(—) | – 88<br>(–3) |
| විවිධ සේවා .. | 2,386<br>(92) | 2,218<br>(80) | + 168<br>(–12) | 2,427<br>(93) | 2,930<br>(106) | + 503<br>(+13) | – 41<br>(–1) | – 712<br>(–26) |
| මුළු සේවා | 8,567<br>(329) | 8,957<br>(324) | + 390<br>(–5) | 10,302<br>(395) | 12,455<br>(451) | +2,153<br>(+56) | –1,735<br>(–66) | –3,498<br>(–127) |
| පෞද්ගලික සංක්‍රාම .. | 7,653<br>(294) | 8,020<br>(291) | + 367<br>(–3) | 622<br>(24) | 722<br>(26) | + 100<br>(+2) | +7,031<br>(+270) | +7,298<br>(+265) |
| නිළ සංක්‍රාම . | 5,154<br>(198) | 3,996<br>(142) | –1,158<br>(–56) | —<br>(—) | —<br>(—) | —<br>(—) | +5,154<br>(+198) | +3,996<br>(+142) |
| මුළු සංක්‍රාම .. | 12,807<br>(492) | 12,016<br>(433) | – 791<br>(–59) | 622<br>(24) | 722<br>(26) | + 100<br>(+2) | +12,185<br>(+468) | +11,294<br>(+407) |
| මුළු සේවා සහ සංක්‍රාම | 21,374<br>(821) | 20,973<br>(757) | – 401<br>(–64) | 10,924<br>(419) | 13,177<br>(477) | +2,253<br>(+58) | +10,450<br>(+402) | +7,796<br>(+280) |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1984 දී රුපියල් දශ ලක්ෂ 2,587 (විගැහි දශ ලක්ෂ 99) ක් වූ සංචාරක කර්මාන්තයෙන් ලත් දළ ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 2,197 (විගැහි දශ ලක්ෂ 80) දක්වා අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් කළ ගැනුම්ද ඇතුළත් විදේශ ණය වෙනුවෙන් වූ පොළී ගෙවීම් මෙම වර්ෂ දෙක තුළදී රුපියල් දශ ලක්ෂ 4,588 (විගැහි දශ ලක්ෂ 176) සිට රුපියල් දශ ලක්ෂ 5,388 (විගැහි දශ ලක්ෂ 196) දක්වා වැඩි විය. පොළී ඉපැයීම්ද 1984 දී ලත් රුපියල් දශ ලක්ෂ 1,478 (විගැහි දශ ලක්ෂ 57) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 2,256 (විගැහි දශ ලක්ෂ 82) දක්වා වැඩි විය. සේවා ගිණුමේ විශාලතම හර අයිතමය ලෙස තවදුරටත් පොළී ගෙවීම් දක්වුන අතර ශුද්ධ පොළී ගෙවීම් 1985 දී ආන්තික වශයෙන් පහත වැටුණි.

අතීතයේදී ගෙවුම් තුලනයේ ඇති වූ පීඩනය ලිහිල් කිරීමට උපකාරී වූ සේවා ගිණුමට, පසුගිය වසර හතර තුළදී එම කාර්යය ඉටු කිරීමට නුපුළුවන් විය. සේවා ගිණුම තුළින් වැය වූ ශුද්ධ විදේශ විනිමය ගෙවීම් ප්‍රමාණය 1985 ජංගම ගිණුම් හිඟයෙන් සියයට 30 ක් පමණ විය.

පෞද්ගලික සංක්‍රාම වශයෙන් ලද විදේශ විනිමය ප්‍රමාණය රුපියල් වටිනාකම අනුව සියයට 5 කින් ඉහළ ගිය නමුත් එහි විගැහි වටිනාකම ආන්තික වශයෙන් අඩුවිය. 1984 දී රුපියල් දශ ලක්ෂ 7,653 (විගැහි දශ ලක්ෂ 294) ක් වූ පෞද්ගලික සංක්‍රාම ලැබීම් සමඟ සසඳන කල 1985 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8,020 (විගැහි දශ ලක්ෂ 291) ක් විය. පෞද්ගලික සංක්‍රාම වෙනුවෙන් ලත් ශුද්ධ ලැබීම් ප්‍රමාණය 1985 දී සියයට 2 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 7,298 (විගැහි දශ ලක්ෂ 265) ක් ව පැවතිණි. තේ වලින් ලත් ආදායමට පසු මෙම වසරේ ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ සටහන් වූ විශාලතම බැර අයිතමය වූයේ පෞද්ගලික සංක්‍රාමයි.

1984 දී රුපියල් දශ ලක්ෂ 5,154 (විගැහි දශ ලක්ෂ 198) ක් වූ යෝජනා ක්‍රම හා භාණ්ඩ ප්‍රදාන අන්තර්ගත නිල සංක්‍රාම ලැබීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 3,996 (විගැහි දශ ලක්ෂ 142) දක්වා අඩු විය. යෝජනා ක්‍රම සඳහා වූ ප්‍රදාන වෙනුවෙන් පසුගිය වසරේ දී ලත් රුපියල් දශ ලක්ෂ 2,701 (විගැහි දශ ලක්ෂ 104) සමග සසඳන විට 1985 දී එය රුපියල් දශ ලක්ෂ 2.620 (විගැහි දශ ලක්ෂ 94) ක් වූ අතර විගැහි වටිනාකම අනුව එහි සියයට 9.6 ක අඩු වීමක් දක්නට ලැබුණි.

ශුද්ධ පෞද්ගලික හා නිල සංක්‍රාම ලැබීම් වල එකතුව 1984 දී රුපියල් දශ ලක්ෂ 12,185 (විගැහි දශ ලක්ෂ 468) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 11,294 (විගැහි දශ ලක්ෂ 407) දක්වා පහත වැටුණද එය භාණ්ඩ හා සේවා ගිණුමේ හිඟයෙන් සියයට 50 ක් පමණ පියවීම සඳහා ප්‍රමාණවත් විය. ජංගම ගණුදෙනුවල ඉතිරි හිඟය වන රුපියල් දශ ලක්ෂ 11,532 (විගැහි දශ ලක්ෂ 417) මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් වලින් හා ශුද්ධ විදේශ වත්කම් උපයෝගී කර ගැනීමෙන් පියවීමට සිදුවිය. ජංගම ගිණුමේ හිඟය සම්පූර්ණයෙන්ම පියවීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයට ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ගලාඒම් ප්‍රමාණවත් නොවීම නිසා ඉතිරි වූ රුපියල් දශ ලක්ෂ 1,060 (විගැහි දශ ලක්ෂ 111) ක් තරම් වූ සමස්ථ ශේෂයේ හිඟය පියවීම පිණිස ශුද්ධ විදේශ වත්කම් උපයෝගී කර ගැනීමට සිදු විය. සමස්ථ ශේෂයේ රුපියල් දශ ලක්ෂ 7,062 (විගැහි දශ ලක්ෂ 297) ක අතිරික්තයක් සටහන් වූ 1984 වර්ෂය හා සසඳන විට මෙම වසරේ වාර්තා වූ ශුද්ධ ප්‍රතිඵලය ඊට ප්‍රතිවිරුද්ධ වූවකි.

අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම වලින් ලැබූ මුළු විදේශ විනිමය ප්‍රමාණය විගැහි වටිනාකම අනුව සියයට 7.4 ක පහත වැටීමක් පෙන්නුම් කෙරිණි. ආනයන, සේවා, පෞද්ගලික සංක්‍රාම හා ප්‍රාග්ධන ආපසු ගෙවීම් වෙනුවෙන් වූ මුළු විදේශ විනිමය වැය වීම් ප්‍රමාණය විගැහි වටිනාකම අනුව බලනවිට සුළු වශයෙන් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1984 දී රුපියල් දශ ලක්ෂ 24,009 (විගැහි දශ ලක්ෂ 919) ක් වූ විදේශ සම්පත් පරතරය 1985 දී රුපියල් දශ ලක්ෂ 28,863 (විගැහි දශ ලක්ෂ 1,043) දක්වා වැඩි විය. විදේශ සම්පත් පරතරයෙන් සියයට 86 ක් පමණ විදේශ ණය ගැනීම් වලින් හා සංචිත උපයෝගී කර ගැනීමෙන් පියවන ලද අතර ඉතිරිය ණයගැති බවක් ඇති නොකරන ප්‍රාග්ධන ලබා ගැනීම් මගින් පියවන ලදී.

1985 දී පෞද්ගලික හා රාජ්‍ය අංශයන්ට ගලා ආ ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,273 (විගැහි දශ ලක්ෂ 336) ක් වූ අතර 1984 දී එය රුපියල් දශ ලක්ෂ 8,755 (විගැහි දශ ලක්ෂ 335) ක් විය. වර්ෂය තුළදී රාජ්‍ය අංශයට ලැබුණ දළ මූල්‍ය නොවන ප්‍රාග්ධනය සියයට 14 කින් පහළ වැටුන අතර රාජ්‍ය අංශය විසින් කළ ණය ආපසු ගෙවීම් සියයට 11 කින් ඉහළ නැගිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය අංශයට ලැබුණ ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය 1984 පැවති රුපියල් දශ ලක්ෂ 8,693 (විගැහි දශ ලක්ෂ 333) සිට රුපියල් දශ ලක්ෂ 7,430 (විගැහි දශ ලක්ෂ 270) දක්වා පහත වැටුණි. කෙසේ වුවත් පෞද්ගලික අංශයට ලැබුණ ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය පසුගිය වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 62 (විගැහි දශ ලක්ෂ 2) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 1,843 (විගැහි දශ ලක්ෂ 66) දක්වා වැඩි වුණි.

**1 . 34 සංඛ්‍යා සටහන**

**1983 — 1985 විදේශ සම්පත් පරතරය පියවීම**

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1983(අ) | 1984(අ) | 1985(ආ) | 1983(අ) | 1984(අ) | 1985(ආ) |
| 1. විදේශීය ඉපැයීම් .. | **39,987** | **53,418** | 52,359 | **1,588** | **2,050** | **1,899** |
| 1.1 අපනයන .. | 25,038 | 37,198 | 35,382 | 993 | 1,427 | 1,284 |
| 1.2 සේවා .. | 8,033 | 8,567 | 8,957 | 320 | 329 | 324 |
| 1.3 පෞද්ගලික සංක්‍රාම .. | 6,916 | 7,653 | 8,020 | 275 | 294 | 291 |
| 2. විදේශීය ගෙවීම් .. | **72,937** | **77,427** | **81,222** | 2,905 | **2,969** | **2,942** |
| 2.1 ආනයන .. | 45,206 | 49,048 | 54,710 | 1,794 | 1,880 | 1,981 |
| 2.2 සේවා .. | 9,444 | 10,302 | 12,455 | 376 | 395 | 451 |
| 2.3 පෞද්ගලික සංක්‍රාම .. | 475 | 622 | 722 | 19 | 24 | 26 |
| 2.4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් .. | 17,812 | 17,455 | 13,335 | 716 | 670 | 484 |
| 3. විදේශ සම්පත් පරතරය .. | **-32,950** | **-24,009** | **-28,863** | **-1,317** | **-919** | **-1,043** |
| 4. සම්පත් පරතරය පියවීම .. | **+32,950** | **+24,009** | **+28,863** | **+1,317** | **+919** | **+1,043** |
| **4.1 ණය ප්‍රමාණය කෙරෙහි බල නොපාන ගණුදෙනු තුලින් පියවීම** .. | **4,945** | **6,096** | **4,834** | **197** | **234** | **172** |
| 4.1.1 නිල ප්‍රදාන .. | 4,016 | 5,154 | 3,996 | 160 | 198 | 142 |
| 4.1.2 සෘජු ආයෝජන .. | 929 | 942 | 838 | 37 | 36 | 30 |
| 4.1.3 විගැහි වෙන්කිරීම .. | — | — | — | — | — | — |
| **4.2 ණය ලබාගැනීම සහ සංචිත උපයෝගිකර ගැනීම** .. | **27,157** | **18,206** | **22,830** | **1,099** | **672** | **901** |
| 4.2.1 දිගු කාලීන ණය .. | 7,330 | 9,410 | 8,834 | 290 | 361 | 320 |
| 4.2.2 කෙටි කාලීන ණය .. | 14,370 | 11,086 | 9,151 | 571 | 424 | 330 |
| 4.2.3 සැපයුම්කරුවන්ගේ ණය සහ අනිකුත් දිගුකාලීන ණය .. | 2,087 | 977 | 588 | 81 | 37 | 22 |
| 4.2.4 වාණිජ ණය ගැනීම් (පෞද්ගලික අංශය) .. | 2,259 | 1,075 | 2,230 | 90 | 42 | 82 |
| 4.2.5 බැංකු ණය ගැනීම් .. | 30 | — | 3 | — | — | — |
| 4.2.6 ද්විපාර්ශ්වික ශේෂ .. | — | — | — | — | — | — |
| 4.2.7 ජා.මූ.අ. කල ගැනීම් .. | 1,622 | 1,288 | 237 | 47 | 31 | — |
| 4.2.8 වෙනත් .. | 1,252 | 285 | 1,213 | 41 | 13 | 23 |
| 4.2.9 සංචිත .. | - 1,793 | - 5,915 | - 574 | - 21 | - 236 | - 124 |
| 5. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | **+ 82** | **- 39** | **+ 1,491** | — | — | — |
| 6. වැරදීම් හා අත්හැරීම් .. | **+ 766** | **- 254** | **- 292** | **+ 21** | **+ 13** | **- 30** |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් ව්‍යවසායයන්හි හා අනිකුත් ව්‍යවසායයන්හි 1985 දී කළ සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 810 (විගැහි දශ ලක්ෂ 29) ක් වන අතර 1984 දී එය රුපියල් දශ ලක්ෂ 830 (විගැහි දශ ලක්ෂ 32) ක්ව පැවතිණි. දිගුකාලීන ප්‍රාග්ධන ස්වරූපයෙන් වූ පෞද්ගලික අංශයට ලැබුණු මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය 1985 දී සැළකිය යුතු ලෙස වැඩි විය. එයාර් ලංකා සමාගම හැර අනිකුත් පෞද්ගලික අංශය වෙත ලබා ගන්නා ලද විදේශ ණය ප්‍රමාණය 1984 වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 362 (විගැහි දශ ලක්ෂ 14) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 2,223 (විගැහි දශ ලක්ෂ 81) දක්වා වැඩි විය. ලංකා නැව් සංස්ථාව, හිල්ටන් හෝටලය හා පැල්වත්ත සීනි සමාගම වෙත ලැබුණු විදේශ ණය හේතුකොටගෙන පෞද්ගලික අංශය විසින් ලබා ගත් විදේශ ණය ප්‍රමාණය විශාල වශයෙන් වැඩි විය. මෙම ව්‍යවසායයන් තුන වෙත 1985 දී ලැබුණු මුළු විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,775 (විගැහි දශ ලක්ෂ 65) ක් විය. 1985 දී එයාර් ලංකා සමාගම විසින් රුපියල් දශ ලක්ෂ 885 (විගැහි දශ ලක්ෂ 33) ක ශුද්ධ ආපසු ගෙවීමක් සිදු කොට ඇත. පසුගිය වසරේ වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 648 (විගැහි දශ ලක්ෂ 25) කින් අඩු වීම හා සසඳා බලනවිට 1985 දී පෞද්ගලික අංශය වෙත ලැබුණු කෙටිකාලීන ප්‍රාග්ධන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 414 (විගැහි දශ ලක්ෂ 14) කින් වැඩි වුණි. 1984 පැවතියාක් මෙන්ම මෙම වසරේදීද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය ගැනීම් ප්‍රමාණය අඩු විය. වසර තුළදී මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යවසායයන් හා ඩුයි ඩොක්ස් සමාගම විසින් ලබා ගන්නා ලද කෙටිකාලීන ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 546 (විගැහි දශ ලක්ෂ 20) කින් වැඩි වූ අතර ලබා ගත් කෙටිකාලීන වෙළෙඳ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 195 (විගැහි දශ ලක්ෂ 7) කින් වැඩි විය.

යෝජනා ක්‍රම සඳහා වූ ණය ලැබීම් පහත වැටීම හා යුරෝ ව්‍යවහාර මුදල් වෙළඳපල ණය ගැනීම් වලින් වැළකී සිටීම 1985 දී රාජ්‍ය අංශයට ලැබුණු දළ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය අඩු වීමට ප්‍රධාන සාධක විය. 1985 දී රුපියල් දශ ලක්ෂ 7,565 (විගැහි දශ ලක්ෂ 273) ක යෝජනා ක්‍රම ණය ලබා ගත් අතර 1984 දී එය රුපියල් දශ ලක්ෂ 7,427 (විගැහි දශ ලක්ෂ 285) ක් විය. 1984 හා 1985 වසර දෙක තුළදී ලබා ගත් භාණ්ඩ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,103 (විගැහි දශ ලක්ෂ 42) සිට රුපියල් දශ ලක්ෂ 1,269 (විගැහි දශ ලක්ෂ 47) දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන් දැනට ක්‍රියාත්මක කරගෙන යන සංවර්ධන යෝජනා ක්‍රම සඳහා ගනු ලබන වාණිජ ණය වලින් සමන්විත වූ අනිකුත් ණය ප්‍රමාණය 1984 පැවති රුපියල් දශ ලක්ෂ 1,857 (විගැහි දශ ලක්ෂ 71) හා සසඳා බලනවිට 1985 දී රුපියල් දශ ලක්ෂ 588 (විගැහි දශ ලක්ෂ 22) ක් විය. රාජ්‍ය අංශයේ විදේශ ණය ආපසු ගෙවීම් 1984 දී රුපියල් දශ ලක්ෂ 1,694 (විගැහි දශ ලක්ෂ 65) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 1,992 (විගැහි දශ ලක්ෂ 72) දක්වා වැඩි විය.


### විදේශ වත්කම්


1984 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 18,942 (විගැහි දශ ලක්ෂ 735) ක් ව පැවති ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 18,367 (විගැහි දශ ලක්ෂ 611) දක්වා පහත වැටිණි. මෙය විගැහි වටිනාකම අනුව සියයට 17 ක පහත වැටීමකි. සමස්ථයක් වශයෙන් ගත්කල ගෙවුම් තුලනයේ ඇති වූ තියුණු පහත වැටීම පිළිබිඹු කරමින් වර්ෂය තුළදී ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය සියයට 39 කින් අඩු වී 1985 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 6,068 (විගැහි දශ ලක්ෂ 173) ක් ව පැවතිණ.

1984 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 13,724 (විගැහි දශ ලක්ෂ 533) ක් ව පැවති, රජයේ හා මහ බැංකුවේ දළ විදේශ වත්කම් වලින් සමන්විත වන දළ නිල සංචිත ප්‍රමාණය 1985 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 12,642 (විගැහි දශ ලක්ෂ 421) ක් ව පැවතිණ. මෙය, පසුගිය වසර අවසානය වනවිට පැවති දළ නිල සංචිත මට්ටම සමඟ සසඳා බලනවිට විගැහි වටිනාකම අනුව සියයට 21 ක අඩු වීමකි. මෙම අඩුවීම ප්‍රධාන වශයෙන්

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

දැක්වෙන්නේ මහ බැංකුව සතු එතෙර ද්‍රවශීල වත්කම් ශේෂයන්හි හා විදේශ සුරැකුම්පත්වල කරන ලද ආයෝජනයන්හිය. 1984 පැවති රුපියල් දශ ලක්ෂ 5,218 (විගැහි දශ ලක්ෂ 202) හා සසඳන විට වාණිජ බැංකු සතු දළ විදේශ වත්කම් ප්‍රමාණයද 1985 දී රුපියල් දශ ලක්ෂ 5,726 (විගැහි දශ ලක්ෂ 190) දක්වා විගැහි වටිනාකම අනුව පහත වැටුණි.

1985 අවසානයේ පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය 1986 සඳහා ඇස්තමේන්තු කර ඇති ආනයන වියදමෙන් මාස 3.8 ක ප්‍රමාණය පියවා ගැනීම සඳහා සෑහිණි.

**විනිමය අනුපාතික වෙනස්වීම්**

සියළුම ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට ප්‍රතිමුඛව 1985 දී ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම අඩු විය. ඩොයිෂ් මාර්ක් හා ප්‍රංශ ප්‍රැන්ක්වලට ප්‍රතිමුඛව රුපියලේ වටිනාකම සියයට 25 බැගින් අඩු වූ අතර ජපන් යෙන් හා එක්සත් රාජධානියේ පවුමට ප්‍රතිමුඛව රුපියලේ වටිනාකම සියයට 23 බැගින් අඩු විය. ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව ද ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම සියයට 6 කින් අඩු විය. ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට ප්‍රතිමුඛව 1985 දී සියයට 4.1 කින් පහත වැටුණි. විගැහි වලට ප්‍රතිමුඛව ඇමෙරිකානු ඩොලරයේ වටිනාකම අඩු වීමේ හා ඇමෙරිකානු ඩොලරයට ප්‍රතිමුඛව රුපියලේ වටිනාකම අඩු වීමේ ප්‍රතිඵලයක් හැටියට විගැහිවලට ප්‍රතිමුඛව වර්ෂය තුළදී රුපියලේ වටිනාකම සියයට 14.1 කින් අඩු විය.

1977 නොවැම්බර් 16 වැනි දින සිට ඇති වූ සමුච්චිත වෙනස්කම්වලට අනුව රුපියලේ වටිනාකම, ඇමෙරිකානු ඩොලරයට ප්‍රතිමුඛව සියයට 41.6 කින්ද, එක්සත් රාජධානියේ පවුමට ප්‍රතිමුඛව සියයට 26.6 කින්ද, ඩොයිෂ් මාර්කයට ප්‍රතිමුඛව සියයට 36.0 කින්ද, ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 52.1 කින්ද, ප්‍රංශ ප්‍රැන්ක්වලට ප්‍රතිමුඛව සියයට 9.1 කින්ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 18.0 කින්ද අඩු වී ඇත. 1977 නොවැම්බර් 16 වැනි දින සිට 1985 අවසානය වනවිට විගැහිවලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම සියයට 37.1 කින් අඩු වී ඇත.

**1 . 35 සංඛ්‍යා සටහන**

**1983 – 1985 විනිමය අනුපාතික වෙනස්වීම්(අ)**

| මුදල් වර්ගය | වර්ෂය අවසානයේ විනිමය අනුපාතික (එකක් රුපියල්) | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතය වෙනස්වීම් (ආ) | |
|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | 1984 | 1985 |
| විශේෂ ගැනුම් හිමිකම් .. | 26·1260 | 25·8065 | 30·0339 | (1·24) | 14·07 |
| ඇ. එ. ජ. ඩොලර් .. | 25·0000 | 26·2800 | 27·4075 | 4·87 | 4·11 |
| එ. රා. ස්ටර්ලින් පවුම් .. | 35·8938 | 30·5111 | 39·5764 | (17·64) | 22·90 |
| ඩොයිෂ් මාර්ක් .. | 9·1050 | 8·3495 | 11·1074 | (9·05) | 24·83 |
| ජපන් යෙන් .. | 0·10712 | 0·10497 | 0·136017 | (2·05) | 22·82 |
| ප්‍රංශ ප්‍රැන්ක් .. | 2·9744 | 2·7276 | 3·6167 | (9·05) | 24·58 |
| ඉන්දියානු රුපියල් .. | 2·3531 | 2·1192 | 2·2575 | (11·04) | 6·13 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.


(අ) වරහන් තුල ඇති සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියලෙහි අගය වැඩිවීම පෙන්නුම් කරයි.

(ආ) වෙනස් වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදල විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය.

ප්‍රධාන වෙළෙඳ හවුල් කරුවන්ගේ වෙළෙඳ බර තැබීම් මත පිළියෙල වූ නාමික විනිමය අනුපාතික ලෙස විග්‍රහ කෙරෙන ශ්‍රී ලංකාවේ සඵල නාමික විනිමය අනුපාතිකය 1985 දී සියයට 16.0 කින් පිරිහුනි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල් කරුවන් වශයෙන් මෙම දර්ශකය ගණනය කිරීමේදී සලකන ලද්දේ ප්‍රංශය, ජර්මනිය, ඉන්දියාව, ජපානය, එක්සත්

# නාමික විනිමය අනුපාතික*

1978 = 100





ශ්‍රී ලංකා මහ බැංකුව.

* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

# සඵල විනිමය අනුපාතික*

1978 = 100




ශ්‍රී ලංකා මහ බැංකුව.

* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

රාජධානිය හා ඇමෙරිකා එක්සත් ජනපදයයි. ශ්‍රී ලංකාව හා මෙම වෙළෙඳ හවුල් කරුවන් අතර උද්ධමන වෙනස්කම් සඳහා ගලපා ගත් පසු ලැබෙන සඵල මූර්ත විනිමය අනුපාතිකය 1985 දී සියයට 10.8 කින් පිරිහින. කාර්තුගත සාමාන්‍ය සඵල නාමික විනිමය අනුපාතිකය 1985 පළවැනි හා සිව්වැනි කාර්තු අතරතුරදී සියයට 17.8 කින් පිරිහුණු අතර සඵල මූර්ත විනිමය අනුපාතිකය මෙම කාලච්ඡේදයන් දෙක තුළදී සියයට 16.5 කින් පිරිහිණ.

**විදේශ ණය**

1984 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 78,413 ක් (විගැහි දශ ලක්ෂ 3,037) ක් වශයෙන් පැවති කෙටිකාලීන ණය හා වෙළෙඳ ණය ගැනීම් ඇතුළු ගෙවීමට ඇති මුළු විදේශ ණය ප්‍රමාණය 1985 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 94,303 (විගැහි දශ ලක්ෂ 3162) දක්වා වැඩි විය. මෙය, විගැහි වටිනාකම අනුව සියයට 4 ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර, ගෙවීමට ඇති ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස ගත්කල මෙම වසර දෙක තුළදී සියයට 52 සිට සියයට 54 දක්වා වැඩිවිණ.

සැපයුම් කරුවන්ගේ ණය ඇතුළුව රජයේ දිගුකාලීන හා මැදිකාලීන ණය මෙම දෙවසර තුළදී රුපියල් දශ ලක්ෂ 54,192 (විගැහි දශ ලක්ෂ 2,104) සිට රුපියල් දශ ලක්ෂ 68,315 (විගැහි දශ ලක්ෂ 2,269) දක්වා වැඩි විය. රජය ලබා ගත් බහු පාර්ශවීය හා ද්විපාර්ශවීය ණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 3,381 (විගැහි දශ ලක්ෂ 22) කින් හා රුපියල් දශ ලක්ෂ 9,894 (විගැහි දශ ලක්ෂ 160) කින් වැඩි විය. වසරතුළ දී විදේශීය මූල්‍ය වෙළෙඳපොල වලින් ලබා ගත් ණය විගැහි දශ ලක්ෂ 14 කින් අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ භාරකාර අරමුදලින් ගත් ණය අත් හැරීමෙන් පසු, ගෙවීමට ඇති රාජ්‍ය අංශයේ සම්පූර්ණ ණය ප්‍රමාණයෙන් යෝජනා ක්‍රම ණය සහ යෝජනා ක්‍රම නොවන ණය පිළිවෙලින් සියයට 53.7 ක් හා සියයට 42.5 ක් විය. රාජ්‍ය සංස්ථා ලබා ගත් ණය වලින් ගෙවීමට ඇති දිගුකාලීන හා මැදිකාලීන ණය විගැහි වටිනාකම අනුව බලන විට 1984 දී විගැහි දශ ලක්ෂ 356 සිට 1985 වනවිට විගැහි දශ ලක්ෂ 306 දක්වා අඩු වින.

**1 . 36 සංඛ්‍යා සටහන**

**1984 – 1985(අ) නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය**

**(බෙදහරින ලද)**

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | විගැහි දශ ලක්ෂ | |
|---|---|---|---|---|
| | 1984(අ) | 1985(ආ) | 1984(අ) | 1985(ආ) |
| **I. දිගු හා මධ්‍යකාලීන** | **64,649·4** | **80,744·7** | **2,509·7** | **2,682·1** |
| 1. රජය .. | 54,191·8 | 68,315·3 | 2,103·7 | 2,269·2 |
| 2. රජය ඇප වූ රාජ්‍යසංස්ථා .. | 9,181·3 | 9,211·4 | 356·4 | 305·9 |
| 3. රජය ඇප වූ පෞද්ගලික අංශය .. | 98·0 | 419·3 | 3·9 | 14·0 |
| 4. රජය ඇප නොවූ රාජ්‍ය සංස්ථා .. | — | — | — | — |
| 5. රජය ඇප නොවූ පෞද්ගලික අංශය .. | 1,178·3 | 2,798·7 | 45·7 | 93·0 |
| **II. කෙටිකාලීන සහ වෙනත්** .. | **13,763·6** | **13,558·6** | **527·0** | **480·0** |
| 1. ජා. මූ. අ. කල ගැනීම් .. | 8,643·6 | 7,913·5 | 328·3 | 292·5 |
| 2. බැංකු ණය ගැනීම් .. | 3·3 | 6·0 | 0·1 | 0·2 |
| 3. වෙනත් (ඇ) .. | 5,116·7 | 5,639·1 | 198·7 | 187·3 |
| **III. නොගෙවා ඉතිරිව ඇති ණය එකතුව (I+II)** | **78,413·0** | **94,303·3** | **3,036·7** | **3,162·1** |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

මූලය :- ශ්‍රී ලංකා මහ බැංකුව.

(ඇ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහන ණය, වෙළඳ ණය සහ ම. කො. ආ. කොමිෂම යටතේ ඇති ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් ණයද ඇතුලත් වේ.

1 . 37 සංඛ්‍යා සටහන

## 1981—1985 නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය

| වර්ගය | රුපියල් දශ ලක්ෂ | | | | | ඩොලර් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1981(අ) | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1985(ආ) | 1981(අ) | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1985(ආ) |
| 1. දිගුකාලීන ණය (ඇ) එයින් .. | 29,172·1 | 34,597·3 | 46,025·0 | 53,680·9 | 67,792·2 | 1,219·6 | 1,471·1 | 1,758·4 | 2,083·9 | 2,251·8 |
| 1·1 යෝජනා ක්‍රම ණය | 9,232·7 | 12,451·8 | 19,531·0 | 25,971·0 | 36,406·0 | 386·0 | 529·5 | 746·2 | 1,008·2 | 1,209·3 |
| 1·2 යෝජනාක්‍රම නොවන ණය .. | 17,433·3 | 19,545·5 | 23,490·3 | 24,805·2 | 28,802·3 | 728·8 | 831·1 | 897·5 | 962·9 | 956·7 |
| 1·3 ජා.මු.අ. භාරකාරත්ව අරමුදල් ණය | 2,506·1 | 2,600·0 | 3,003·7 | 2,904·7 | 2,583·9 | 104·8 | 110·5 | 114·7 | 112·8 | 85·8 |
| 2. සැපයුම්කරුවන්ගේ ණය .. | 1,114·6 | 996·6 | 889·4 | 588·6 | 561·8 | 46·6 | 42·4 | 34·0 | 22·8 | 18·7 |
| 3. ජා.මු.අ. භාවිත ණය .. | 7,617·0 | 7,977·0 | 8,225·4 | 8,643·6 | 7,913·5 | 346·3 | 341·5 | 331·1 | 328·3 | 292·5 |
| 4. බැංකු ණය ගැනීම් .. | 228·6 | 1,824·1 | 1,853·7 | 3·3 | 6·0 | 9·6 | 77·6 | 70·8 | 0·1 | 0·2 |
| 5. වෙනත්(ඈ) .. | 6,469·2 | 10,766·9 | 15,185·5 | 15,496·6 | 18,029·8 | 270·5 | 457·8 | 580·2 | 601·6 | 598·9 |
| එකතුව .. | 44,601·5 | 56,161·9 | 72,179·0 | 78,413·0 | 94,303·3 | 1,892·6 | 2,390·4 | 2,774·5 | 3,036·7 | 3,162·5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සැපයුම් කරුවන්ගේ ණය අත්හැරීමෙන් පසු රජයේ ණය.
(ඈ) රාජ්‍ය සංස්ථාවල හා එයාර් ලංකා සමාගමේ වෙළෙඳ ණය, ම.කො.ආ. කොමිසම යටතේ ඇති සහ අනෙකුත් අනුමත ව්‍යවසායයන්, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලින් ගත් ණය, පෞද්ගලික විදේශීය ණය ගැනීම් සහ වෙළෙඳ ණය වලින් සමන්විතය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.38 සංඛ්‍යා සටහන

### 1981 — 1985 ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1981 | 1982 | 1983 | 1984 | 1985(අ) | 1981 | 1982 | 1983 | 1984 | 1985(අ) |
| 1· ණය සේවා ගෙවීම් | 4,449·7 | 5,216·6 | 7,135·8 | 8,026·1 | 9,920·5 | 197·4 | 227·5 | 287·1 | 308·0 | 360·4 |
| 1·1 ණය ආපසු ගෙවීම් | 2,084·1 | 2,563·3 | 3,120·7 | 3,437·7 | 4,532·4 | 93·8 | 112·0 | 126·5 | 132·3 | 165·0 |
| (i) ජා. මූ. අරමුදලට .. | 1,289·2 | 1,146·3 | 1,097·3 | 593·3 | 967·4 | 59·1 | 49·9 | 46·2 | 22·7 | 35·8 |
| (ii) අනෙකුත් (ආ) .. | 794·9 | 1,417·0 | 2,023·4 | 2,844·4 | 3,565·0 | 34·7 | 62·1 | 80·3 | 109·6 | 129·2 |
| 1·2 පොළී ගෙවීම් .. | 2,365·6 | 2,653·3 | 4,015·1 | 4,588·4 | 5,388·1 | 103·6 | 115·5 | 160·6 | 175·7 | 195·4 |
| (i) ජා. මූ. අරමුදලට .. | 487·6 | 519·5 | 749·3 | 819·2 | 745·6 | 21·7 | 22·4 | 30·8 | 31·4 | 27·1 |
| (ii) අනෙකුත් .. | 1,878·0 | 2,133·8 | 3,265·8 | 3,769·2 | 4,642·5 | 81·9 | 93·1 | 129·8 | 144·3 | 168·3 |
| 2· භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම්. | 26,526·1 | 28,059·8 | 33,071·6 | 45,764·9 | 44,338·7 | 1,168·2 | 1,221·7 | 1,312·9 | 1,756·1 | 1,608·3 |
| 3· භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලැබීම්. .. | 30,955·9 | 34,083·5 | 39,987·2 | 53,418·0 | 52,358·3 | 1,363·3 | 1,484·1 | 1,588·0 | 2,049·6 | 1,899·4 |
| 4· ණය සේවා අනුපාතික (ඇ) (2හි ප්‍රතිශතයක් වශයෙන්) | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 16·8 | 18·6 | 21·6 | 17·5 | 22·4 | 16·9 | 18·6 | 21·9 | 17·5 | 22·4 |
| (ii) ජා. මූ. අ. ගණුදෙනු හැර .. | 10·1 | 12·7 | 16·0 | 14·4 | 18·5 | 10·0 | 12·7 | 16·0 | 14·5 | 18·5 |
| 5· ණය සේවා අනුපාතික (ඇ) (3හි ප්‍රතිශතයක් වශයෙන්) | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. .. | 14·4 | 15·3 | 17·8 | 15·0 | 18·9 | 14·5 | 15·3 | 18·1 | 15·0 | 19·0 |
| (ii) ජා. මූ. අ. ගණුදෙනු හැර .. | 8·6 | 10·4 | 13·2 | 12·4 | 15·7 | 8·6 | 10·4 | 13·2 | 12·4 | 15·7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික.

(ආ) තොරතුරු ලබාගැනීමට නොහැකි වීම නිසා ම. කො. ආ. කොමිසමේ ව්‍යවසායයන්ට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් නිකුත් කළ ණය සහ අනෙකුත් අනුමත ව්‍යවසායයන්ට වි. ව්‍ය. මු. බැ. ඒකක වලින් නිකුත් කළ සමහරක් ණය වෙනුවෙන් වූ ආපසු ගෙවීම් මීට ඇතුළත් නොවේ.

(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම් හේතුවෙන්. රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

1984 දී රුපියල් දශ ලක්ෂ 64,649 (විගැහි දශ ලක්ෂ 2,510) ක් වූ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙහිම දිගුකාලීන හා මැදිකාලීන මුළු ණය ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 80,745 (විගැහි දශ ලක්ෂ 2,682) දක්වා වැඩි විය. දිගුකාලීන හා මැදිකාලීන ණය 1985 දී ගෙවීමට ඇති මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 85 ක් වූ අතර පසුගිය වසරේ දී එය සියයට 83 ක් ව පැවතිණි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අළුතින් ණය ගැනීමක් නොතිබූ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඇති ශ්‍රී ලංකාවේ ණය බැඳියාව පසුගිය වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 8,644 (විගැහි දශ ලක්ෂ 328) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 7,914 (විගැහි දශ ලක්ෂ 293) දක්වා අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගත් ණය අත් හැරීමෙන් පසු, ලබාගත් කෙටිකාලීන හා අනිකුත් ණය මෙම වසර දෙක තුළ දී රුපියල් දශ ලක්ෂ 5,120 සිට රුපියල් දශ ලක්ෂ 5,645 දක්වා වැඩි වූ නමුත් විගැහි වටිනාකම අනුව එය සියයට 6 ක අඩුවීමකි.

**ණය සේවා ගෙවීම්**

දිගුකාලීන සහ මැදිකාලීන ණය ආපසු ගෙවීම් වලින් හා සියළුම විදේශ ණය වෙනුවෙන් වූ පොලී ගෙවීම් වලින් සමන්විත ණය සේවා ගෙවීම් 1984 හා 1985 වසර දෙක තුළදී රුපියල් දශ ලක්ෂ 8,026 (විගැහි දශ ලක්ෂ 308) සිට රුපියල් දශ ලක්ෂ 9,921 (විගැහි දශ ලක්ෂ 360) දක්වා වැඩි විය[1]. වසර තුළදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කල ප්‍රති මිළදී ගැනීම් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු වෙනුවෙන් වූ පොලී සහ සේවා ගාස්තු ගෙවීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 967 (විගැහි දශ ලක්ෂ 36) ක් හා රුපියල් දශ ලක්ෂ 746 (විගැහි දශ ලක්ෂ 27) ක් වූ අතර 1984 දී එය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 593 (විගැහි දශ ලක්ෂ 23) ක් හා රුපියල් දශ ලක්ෂ 819 (විගැහි දශ ලක්ෂ 31) ක් විය.

1984 දී මුළු ණය සේවා ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් වලින් (විගැහි වටිනාකම අනුව) සියයට 17.5 ක් වූ අතර 1985 දී එම ප්‍රතිශතය සියයට 22.4 දක්වා වැඩි වී ඇත. මෙම ප්‍රතිශතය මෙසේ තියුණු ලෙස ඉහළ යෑම අපනයන ඉපැයීම් අඩු වීමේ හා ණය සේවා ගෙවීම් ඉහළ යාමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කළ ගනුදෙනු අත්හැර ගණනය කෙරෙන ණය සේවා අනුපාතිකයද සියයට 14.5 සිට සියයට 18.5 දක්වා මෙම වර්ෂ දෙක තුළදී වැඩි වී ඇත. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම යන අංශ වලින් ලත් ඉපැයීම්වල ප්‍රතිශතයක් ලෙස ගත් කල සමස්ථ ණය සේවා අනුපාතිකය 1984 දී සියයට 15.0 සිට 1985 දී සියයට 19.0 දක්වා වැඩි විය.

---

1. මහ කොළඹ ආර්ථික කොමිෂම යටතේ වන ව්‍යාවසායයන්ට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් ලබා දෙන ලද ණය හා හඳුනාගෙන නොමැති සමහර වි. ව්‍යා. මු. බැ. ඒකක ණය වෙනුවෙන් වූ ණය ආපසු ගෙවීම් මෙම සංඛ්‍යාවන්ට ඇතුළත් නොවන අතර එම ණය වෙනුවෙන් වූ පොලී ගෙවීම් ඇතුළත් කොට ඇත.